ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2023(2024 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2023 (March 2024)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

වැදගත් :❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කටපමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසින් ප්‍රශ්න 2ක් ද, II කොටසෙන් ප්‍රශ්න 2ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

❖ **පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.**

01. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බහුලව යටි රෝපණ වගාවක් ලෙස අන්නාසි වගාව දැකිය හැකිය. එහෙත් බොහෝ විට අස්වැන්නේ බොහෝ කොටසක් අපතේ යයි. මේ පිළිබඳ අධ්‍යයනයක් කළ චතුර අන්නාසි ජෑම් හා කෝඩියල් නිපදවා අළෙවි කිරිමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ව්‍යාපෘති වාර්තාවක් සකසන ලදි.

2024.01.01 දින එම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගත් අතර රජයේ වාණිජ බැංකුවකින් ඒ සඳහා 12% පොලියට රු. ලක්ෂ 5ක ණය මුදලක් අනුමත විය.

2024.01.15 දින සිට චතුර වගකීම සීමිත ව්‍යාපාරයක් ලෙස තම ව්‍යාපාරය ලියාපදිංචි කරන ලදි. එදිනට බැංකු ණය මුදල ලබා ගත් අතරම ඔහු ඉතිරි කර ගත් රු.300,000ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීය පියාගෙන් රු. 200,000 ක කඩ කාමරය ව්‍යාපාරය සඳහා චතුරට ලියා දෙන ලදි.

ජනවාරි 16 දින රු. 400,000 කට යන්ත්‍රයක් මිලදී ගෙන කඩ කාමරයේ සවි කරන ලදි.ආයතනයේ නිෂ්පාදන කටයුතු සඳහා සේවකයින් තිදෙනෙකු ඇතුළුව සේවකයින් 5දෙනෙක් රු. 10,000 බැගින් මාසික වැටුපකට බඳවා ගන්නා ලදි.

නිෂ්පාදිත බෙදාහැරීම සඳහා මිතුරකුගේ වෑන් රථයක් කුලි පදනම මත ලබා ගත්හ.
පළමු මාසයේ ගනුදෙනු පහත වේ.

| | |
|---|---|
| අන්නාසි මිලදී ගැනිම | රු. 50,000 |
| විදුලිය සඳහා | රු. 5,000 |
| ඇසුරුම් බෝතල් සඳහා | රු. 10,000 |
| ලේබල් මුද්‍රණයට | රු. 2,000 |
| ණය වාරිකය හා පොලිය | රු. 15,000 |
| වෑන් රථ කුලිය | රු. 15,000 |

❖ කෝඩියල් බෝතල් 700ක් හා ජෑම් බෝතල් 300 නිපදවන ලදි.

❖ කෝඩියල් බෝතලයක් රු. 400 බැගින් අත්පිට මුදලට බෝතල් 500ක් විකුණු අතර ණය පදනම මත බෝතල් 200ක් විකුණන ලදි.

ජෑම් බෝතල් 250ක් රු. 200 බැගින් අත්පිට මුදලට විකුණු අතර බෝතල් 50ක් ණයට විකුණන ලදි. නිෂ්පාදිත සියල්ල අළෙවි විය.

නිෂ්පාදිත දිවයින පුරා අලෙවි කිරිම සඳහා චතුර තමාගේම වෑන් රථයක් ලබා ගැනීමට අදහස් කරයි.

(i) (අ) චතුරගේ ව්‍යාපාරයට නමක් යෝජනා කරන්න.
(ආ) ඒ නම ලියාපදිංචි කළ යුත්තේ කුමන පනතක් යටතේ ද?

(ii) (අ) මෙම කර්මාන්තය සඳහා අවසර ලබා ගත යුත්තේ කුමන ආයතනයකින් ද?
(ආ) මෙම ජෑම් හා කෝඩියල් ඉහල ගුණත්වයෙන් යුක්ත යැයි ප්‍රකාශ කිරීමට හා පාරිභෝගිකයන්ට ඒත්තු ගැන්වීමට කළ යුත්තේ කුමක් ද?

(iii) (අ) චතුර ණය ලබා ගත්තේ යැයි ඔබ සිතන බැංකුවේ නම ලියන්න.
(ආ) වෑන් රථය තම අයිතියට ලබා ගැනිමේ දී විශාල මුදලක් එකවර වැයවේ. එසේ නොකර චතුරට ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග මොනවා ද?

(iv) (අ) මෙම සිද්ධිය තුළ අළෙවිකරණ මිශ්‍රයේ අතුලත් විචල්‍යන් තුළින් නිෂ්පාදිත විචල්‍යයේ අයිතම දෙකක් ලියන්න.
(අ) මෙම සිද්ධියේ වඩාත් කැපි පෙනෙන කළමණාකරණ කාර්යයන් දෙක නම් කරන්න.

(v) (අ) 2024.01.15 දිනට ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියා දක්වන්න.
(ආ) යන්ත්‍රය මිලදී ගැනිමේ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(vi) (අ) මෙම ව්‍යාපාරය විසින් භාවිත කළ යුතු මුලික සටහන් පොත් දෙකක් ලියන්න.
(ආ) එම මුලික පොත්වල සටහන් තැබීම සඳහා අවශ්‍ය මුලාශ්‍ර ලේඛණ ලියන්න.

(vii) (අ) නිෂ්පාදන ආයතනයේ ප්‍රාථමික පිරිවැය ගණනය කරන්න.
(ආ) මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(viii) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම නොවන වත්කම් දෙකක් ලියන්න.
(ආ) ණයගැතියන්ගෙන් ඉක්මනින් මුදල් ලබා ගැනිම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය කුමක්ද ?

(ix) (අ) සියලු ගනුදෙනු මුදල් පොතේ සටහන් කරන්න.
(ආ) 2024.02.15 දිනට අත ඉතිරි මුදල් කියද?

(x) (අ) පළමු මාසයේ ලාභය හෝ අලාභය සොයන්න.
(ආ) 2024.02.15 දිනට චතුරගේ හිමිකම කොපමණ ද?

## I **කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. (i) නිෂ්පාදිනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරන අකාර දෙක දක්වන්න.

(ii) හලාවත පදිංචි කොඩිතුවක්කු මහතා ඉවතලන පොල් කටු භාවිත කර ඉතා අනර්ඝ විසිතුරු නිර්මාණය කර අළෙවි කරයි. නවෝත්පාදන බිහිකිරිම ඔහුගේ අපේක්ෂාව වන අතර වර්තමාන ආර්ථික පරිහානිය තුළ ආදායම් වලට ද ව්‍යාපාරික වශයෙන් ඔහු මුහුණ දී ඇත.
අ. කොඩිතුවක්කුගේ මෙම ක්‍රියාවලිය කුමන නිෂ්පාදන සාධකයකට අයත්වේ ද?
ආ. ඔබ (අ) හි නම් කළ නිෂ්පාදක සාධකය හඳුන්වන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම බාහිර පරිසර සාධකයක් ලෙස දේශපාලන පරිසරයට අයත් වේ.

ආ. පිලිගත් සන්නම් නාමයක් පැවතීම එම ව්‍යාපාරයට අවස්ථාවකි.

ඉ. චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකුට තම නළු නිළියන් රක්ෂණය කිරීමට රක්ෂ්‍ය හිමිකමක් ඇත.

ඊ. මැද පෙරදිග රටවලින් ඛණිජතෙල් මිලදී ගැනීම ආනයන වෙළෙඳාමට උදාහරණයකි.

(iv) දෛනික ව්‍යාපාරික අවසන් කළ අශේන් ව්‍යාපාර ස්ථානයේ ම රාත්‍රිය ගත කල අතර මධ්‍යම රාත්‍රියේ ව්‍යාපාර ස්ථානයට ඇතුළුවීමට තැත් කරන සොරෙකු පිළිබඳ CCTV කැමරා මගින් දැක ගත හැකි විය. වහාම ළඟම පොලීසියට දුරකථන ඇමතුමක් මගින් ඒ බව දැනුම් දුන්හ. පොලිසිය ඉතා ඉක්මනින් ව්‍යාපාර ස්ථානයට එන බන පැවසීය.

අ. ඉහත සිද්ධියට අනුව සන්නිවේදනයේ ප්‍රතිපෝෂණය මූලිකාංගයට අදාල ක්‍රියාව වන්නේ කුමක්ද ?

ආ. සිද්ධියේ ඇතුළත් සන්නිවේදනයේ ස්වරූපය හා මාධ්‍ය නම් කරන්න.

(ලකුණු 08 යි)

03. (i) අ. කළමණාකරණය යනු කුමක් ද ?

ආ. කලමණාකරණ කාර්යයක් වන සැලසුම්කරණය යන්න පැහදිලි කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. පාසලේ වාණිජ දිනය පැවැත්වීම සඳහා කළ යුතු කාර්යයන් තීරණය කිරීම හා අවශ්‍ය මුදල් හා සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම සංවිධානයට අයත් කාර්යයකි.

ආ. නිෂ්පාදකයා විසින් තම නිෂ්පාදිත පාරිභෝගිකයාට බෙදාහැරීම ප්‍රවර්ධනයට අයත් වේ.

ඉ. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුත්තේ ආයෝජනයේ අවදානම හා ප්‍රතිලාභ පමණි.

ඊ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට කෙටිකාලීන මුල්‍ය අවශ්‍යතා වෙනුවෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

(iii) විසිතුරු භාණ්ඩ අළෙවිසැලක් පවත්වාගෙන යන ධනපාල මහතා තම වෙළෙඳ සැලෙන් භාන්ඩ මිලට ගන්නා ගනුදෙනුකරුවන්ට කුමන හෝ තිළිණයක් ලබා දීමට අමතක නොකරයි.

අ. එය අළෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යට අයත්වේ ද?

ආ. චමෝද් විසින් නිෂ්පාදනය කරනු ලබන බිම්මල් ගනුදෙනුකරුවන්ට අලෙවිකිරීම සඳහා යොදා ගත හැකි මාර්ග 2ක් නම් කරන්න.

(iv) පියදාසට රු. 70,000 ක ස්ථාවර තැන්පතුවක් ද, සුමනදාස රු. 40,000 කොටස් වෙළෙඳ පොල ආයෝජනයක් ද, සෝමදාසට රු. 120,000ක ඉතිරිකිරීමේ තැන්පතුවක් ද ඇත.

අ. ඉහත ප්‍රකාශයේ ඇතුළත් තිදෙනාගෙන් වැඩිම අවදානමක් සහිත ආයෝජනය සිදුකර ඇත්තේ කවුද ?

ආ. සෝමදාසගේ අපේක්ෂිත ප්‍රතිලාභය සුමනදාගේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයට වඩා වැඩි විය යුතුය. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද ? පිළිතුරට හේතුවක් ලියන්න.

(ලකුණු 08 යි)

## II කොටස - ගිණුම්කරණය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. (i) "සුදාගේ" ව්‍යාපාරයේ 2024.01.01 දිනට මුළු වත්කම් හා වගකීම් පහත වේ.

| | |
|---|---|
| ලී බඩු | රු. 200,000 |
| බඩුතොගය | රු. 120.000 |
| ණයගැතියෝ | රු. 40,000 |
| මුදල් ශේෂය | රු. 80,000 |
| ණයහිමියෝ | රු. 25,000 |

2024 ජනවාරි මාසයේ සුදාගේ ව්‍යාපාරයේ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත වේ.

| | වත්කම් | | | = | හිමිකම + වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | ලී බඩු | බඩුතොගය | ණයගැති | මුදල් | හිමිකම | ණයහිමියෝ |
| 1/8 | | | | - 15,000 | -15,000 (වැටුප්) | |
| 1/14 | | | - 10,000 | + 10,000 | | |
| 1/20 | | + 12,000 | | | | + 12,000 |
| 1/24 | - 20,000 | | | + 20,000 | | |
| 1/29 | | - 20,000 | + 30,000 | | + 10,000 (ලාභය) | |

**අවශ්‍ය වන්නේ,**

අ. 2024.01.08 දින සිදු වි ඇති ගනුදෙනුව වටිනාකම් සහිතව ලියන්න.

ආ. 2024.01.29 දිනට හිමිකම කීය ද?

ඉ. 2024.01.31 දිනට ජංගම වත්කම් වල වටිනාකම සොයන්න.

ඊ. 2024.01.31 රු. 100,000ක් වටිනා ලී බඩු සුදා විසින් ව්‍යාපාරයට යෙදවීම ඉහත සමීකරණයට බලපාන අයුරු පෙන්වන්න.

(ii) මැතිව්ගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට පිළියෙළ කල ශේෂ පිරික්සුම පහත වේ.

**ශේෂ පිරික්සුම**

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මුදල් | 88,000 | |
| ගැණුම් | 142,000 | |
| විකුණුම් | | 248,000 |
| මෝටර් රථ | 220,000 | |
| ණයගැතියෝ | 44,000 | |
| ණයහිමියෝ | | 82,000 |
| ප්‍රාග්ධනය | | 300,000 |
| දුරකථන ගාස්තු | 24,500 | |
| බෙදාහැරීමේ වියදම් | 32,500 | |
| ණය පොලී | 10,200 | |
| අවිනිශ්චිත ගිණුම | 68,800 | |
| | 630,000 | 630,000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරිමේ දී පහත වැරදි අණාවරණය විය.

- ❖ ගෙවු දුරකථන ගාස්තු රු. 24,500 දුරකථන ගාස්තු ගිණුමේ ර. 26,500ක් ලෙස සටහන් වීම.
- ❖ ණයහිමියන්ට ගෙවු රු. 24,000ක් අදාල ණයහිමි ගිණුමට බැර කිරිම.
- ❖ දුන් වට්ටම් ගිණුමේ ශේෂය රු. 22,800, ශේෂ පිරික්සුමට ගෙන නොතිබිම.

**අවශ්‍ය වන්නේ,**

අ. ඉහත වැරදි නිවැරදි කිරිමට අදාල ජනල් සටහන්

ආ. ඉහත වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න.

iii. "යෂ් ගේ" ව්‍යාපාරයේ 2023 ඔක්තෝම්බර් මාසයේ පිළියෙල කල බැංකු ගිණුම හා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශණය පහත දැක්වේ.

**බැංකු ගිණුම**

| දිනය | ල.අ. | විස්තරය | ස.පි. | බැංකු | දිනය | ව.අ. | විස්තරය | ස.පි. | බැංකු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10/1 | | ශේෂය | | 44,000 | 10/7 | | ණයහිමි 3342 | | 7,000 |
| 10/10 | | චෙක් තැන්පත් 6234 | | 10,200 | 10/12 | | වැටුප් 3343 | | 5,000 |
| 10/24 | | චෙක් තැන්පත් 7185 | | 15,000 | 10/28 | | ගැණුම් 3344 | | 18,000 |
| | | | | | 10/31 | | ශේෂය ප/ගෙ | | 39,200 |
| | | | | 69,200 | | | | | 69,200 |
| 11/1 | | ශේෂය ඉ/ගෙ | | 39,200 | | | | | |

**බැංකු ප්‍රකාශණය**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 10/1 | ශේෂය | | | 44,000 |
| 10/8 | චෙක් අංක 3342 | 7,000 | | 37,000 |
| 10/11 | චෙක් තැන්පත් 6234 | | 10,200 | 47,200 |
| 10/13 | චෙක් අංක 3343 | 5,000 | | 42,200 |
| 10/20 | ස්ථාවර නියෝග (ණය පොලි) | 8,000 | | 34,200 |
| 10/29 | සෘජු ප්‍රේශණ | | 11,800 | 46,000 |

**අවශ්‍ය වන්නේ,**

අ. 2023.10.31 දිනට සංශෝධිත බැංකු ගිණුම.

ආ. 2023.10.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියල කරන්න. (ලකුණු 12 යි)

05. (i) ගඩොල් කැට නිෂ්පාදනය කරන සාගරගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයට අදාල තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ඒකකයක නිස්පාදන පිරිවැය | රු. 10 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 10,000 |
| සෘජු ශ්‍රමය හා වෙනත් පිරිවැය | රු. 12,000 |
| මාසයට අදාල නිෂ්පාදන ඒකක ගණන | 3,000 |

ඒකකයකින් පිරිවැය මත 20% ලාභාංතිකයක් තබා ඇත.

**අවශ්‍ය වන්නේ,**

අ. මුළු පිරිවැය

ආ. ජනවාරි මාසයට අදාල ප්‍රාථමික පිරිවැය

ඉ. ගඩොල් කැටයක විකුණුම් මිල

ඊ. සෘජු ද්‍රව්‍ය පිරිවැය සොයන්න.

ii. චාමිකගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම පහත වේ.

**ශේෂ පිරික්සුම**

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 300,000 |
| 01.01.2023 තොගය | 5,000 | |
| ගැණුම් | 33,000 | |
| විකුණුම් | | 85,000 |
| ලද වට්ටම් | | 4,000 |
| රක්ෂණය | 1,500 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 320,000 | |
| වේතන | 4,000 | |
| ප්‍රචාරණය | 2,000 | |
| 12% බැංකු ණය | | 50,000 |
| වරිපනම් ගාස්තු | 500 | |
| බැංකු ණය පොලී | 4,000 | |
| ණය ගැතියෝ | 25,000 | |
| ණයහිමියෝ | | 2,000 |
| බැංකු ශේෂය | 40,000 | |
| අතැති මුදල් | 6,000 | |
| | 441,000 | 441,000 |

**අමතර තොරතුරු**

1. 2023.12.31 දිනට තොගය 12,000
2. ගොඩනැගිලි වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
3. ණයගැතියන්ගෙන් 10% ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.
4. උපචිත ප්‍රචාරණ වියදම් රු. 1,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2023.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

(ලකුණු 12 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.